# 'පීකේ' චිත්‍රපටයෙන් ඉන්දියාවේ ආගම සහ සංස්කෘතියට සිදුවන බලපෑම පිළිබඳ අධ්‍යයනයක්

*ජයතුංග, විජිතා කුමාරි*[1]

ආමීර් ඛාන් සහ අනුෂ්කා ෂර්මා ප්‍රධාන චරිතවලට පණ පොවන **'පීකේ'** චිත්‍රපටය රාජ් කුමාර් හිරානිගේ අධ්‍යක්ෂණයකි. අහිංසක මිනිසුන්ගේ දුක් ගැනවිලි උකසට තබා ගනිමින් මුදල් ගරා ගන්නා දේව තැරැව්කරුවන් නිර්දය උපහාසයට ලක් කිරීම මෙම චිත්‍රපටයේ අභිලාෂය වී ඇත. මෙය ඉදිරිපත් කෙරෙනුයේ පිටසක්වල ජීවියෙකු මුල් කරගත් අපූරු කතාවක් ඔස්සේය. මේ පිටස්තරයා රූපයෙන් මෙලොව වැසියන්ට සමාන වන අතර ඔහු සිටින්නේ නිරුවතිනි. තමන්ගේ ලෝකය හා පණිවිඩ හුවමාරු කරන දුරස්ථ පාලකය ඔහු සතු එකම වස්තුව වන අතර ඔහු මෙලොවට පා තැබූ පළමු මොහොතේම එය කිසිවෙකු විසින් පැහැර ගනු ලබයි. ඔහුට දෙවි පිහිට පැතීමට සිදුවන්නේද දුරස්ථ පාලකය සොයා ගැනීම සඳහාය. දෙවියන් සොයා යන ගමනේදී ඔහු නොයෙක් වංචාකරුවන්ට හසු වී අකරතැබ්බ රාශියකට මුහුණ දෙයි. දෙවියන් රහිත ලොවකින් පැමිණි මේ පුද්ගලයා මගින් මෙලොව පවතින ආගමික, සංස්කෘතික හා වාර්ගික බෙදීම් ප්‍රශ්න කරන මෙම සිනමා නිර්මාණය ප්‍රේක්ෂකයා මානුෂීය ලොවක් කරා රැගෙන යාමට ද සමත් වෙයි. මෙම අධ්‍යයනය සඳහා මා තෝරා ගත් ගැටළුව වන්නේ **'පීකේ'** චිත්‍රපටයෙන් ඉන්දියාවේ ආගම සහ සංස්කෘතියට බලපෑමක් කරන්නේද? යන්නයි. ආගම, දෙවියන්, ඇදහිලි, භක්තිය හා සංස්කෘතික නිර්මිතයන් යනාදිය සපුරා බැහැර කරන මෙම චිත්‍රපටය මගින් ඉන්දීය සමාජයෙහි ඇති ආගමික සංකල්පවලට පහර ගසන්නේද යන්න අධ්‍යයනය කිරීම මෙහි අරමුණයි. මෙය ගුණාත්මක අධ්‍යයනයක් වන අතර දත්ත රැස් කිරීම සඳහා අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමය යොදාගෙන ඇත. මෙම අධ්‍යයනය හරහා අවසාන වශයෙන් එළඹෙන නිගමනය වනුයේ **'පීකේ'** චිත්‍රපටයෙන් ඉන්දීය සමාජයේ ආගම, දෙවියන්, භක්තිය, ඇදහිලි හා සංස්කෘතික නිර්මිතයන් යනාදිය ප්‍රශ්න කරමින් ඒවා සපුරා බැහැර කරන බවයි.

**ප්‍රමුඛ පද :** පීකේ, චිත්‍රපට, දෙවියන්, සංස්කෘතිය

[1] *ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර, ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*jayathungavk@gmail.com*